# ඇසි දිසි මානයෙන් ඔබ්බට ගිය
# දහම් පාසල් යථාර්ථය



**දයා අමරසේකර** පේරාදෙණිය විශ්වවිද්‍යාලය
(dayaamarasekera@gmail.com)

ඉරිදා බෞද්ධ දහම් පාසල් ව්‍යාපාරය මෙරට යටත් විජිත යුගය තුළ දැකිය හැකි ජාතික ව්‍යාපාරයේ ප්‍රතිඵලයක් ලෙස ගොඩ නැඟුණකි. පුද්ගලයාගේ ජීවිතයේ ආර්ථිකය මූලික කරගත් සමෘද්ධිය ඇති කොට ඔහු ඉහළට ඔසවා තැබීම සාමාන්‍ය අධ්‍යාපනයේදී අපේක්ෂිත ඉලක්කයක් සේ සලකතද, දහම් පාසලේදී ලබන්නේ ගුණය සහ ආකල්ප මූලික කරගත් පෞරුෂ වර්ධනයක් යැයි සැලකේ. ඒ නිසාම දහම් පාසල යොමුව පවතින්නේ දැනුමට වඩා ආකල්ප වර්ධනය සඳහාය. දහම් පාසල මෙරටේ ගොඩනැගුණ යටත් විජිත වකවානුව, එසේ ආකල්ප සාධනය, අත්‍යවශ්‍ය සමාජ කාර්යයක්ව තිබූ යුගයකි. බුදු දහම යටපත් වී පැවති ඒ යුගයේ ඒ අඩි ඔසවා තැබීමට එදා එච්.එස්. ඕල්කොට් වැනි නායකයින් ක්‍රියාත්මක වූ අන්දම, බෞද්ධ පුනරුදයක් ලෙස මෙරට ජාතික ඉතිහාසයට එක් වී ඇත. මෙරටේ මුල්ම දහම් පාසල ලෙස සැලකෙන්නේ 1864 දී පමණ පරම විඥානාර්ථ බෞද්ධ සමාගම මගින් අරඹනු ලැබූ ගාල්ලේ විජයානන්ද දහම් පාසලයි. මුල් අංග සම්පූර්ණ බොදු විදුහල ලෙස 1886දී පමණ කොළඹ ආනන්ද විදුහල පිහිටුවීමේ ප්‍රධාන අරමුණක් ලෙස එහි නිර්මාතෘවරයෙකු වූ එච්.ඊ. ලෙබ් පීටර් ප්‍රකාශ කර සිටියේ මෙරටේ ගුරුවරුන් වන අයට එමගින් බුද්ධාගම ඉගැන්වීමට පුහුණුවක් ලබාදීමය. ඉන් පසුව කොළඹ තරුණ බෞද්ධ සංගමය මගින් ඩී.බී. ජයතිලක, එෆ්.ආර්. සේනානායක වැනි නායකයින් මෙම දහම් පාසල් ව්‍යාපාරය තරග ව්‍යාපාර පැවැත්වීම දක්වා විෂයිගත මට්ටමින් දියුණු කළ අතර, 1956 සම්බුද්ධ ජයන්තියෙන් පසුව තවදුරටත් පාසල් අධ්‍යාපනයට බෙහෙවින් සමපාත වූ පාසල් විශේෂයක් ලෙස රට පුරා වේගයෙන් පැතිර ගිය ව්‍යාපාරයක් විය.

මෙලෙස ඕල්කට් බෞද්ධ ප්‍රබෝධයේ 'දරුවෙකු' ලෙස උපත ලද දහම් පාසල අද ආගමික වශයෙන් ඉස්මතුව පෙනෙන තවත් එක් සමාජ ආයතනයකි. අනෙක් අතට පන්සල හා බැඳුණු සමාජ ආයතනයකි. නූතනයේ මෙම දහම් පාසල ඉටුකරමින් සිටින කාර්යභාරය මේ නිසාම සමාජ විද්‍යාත්මකව විමසා බැලීම වැදගත්ය. එය අපේ සංස්කෘතික ඉතිහාසය සමාජය තුළ වර්ධනය වීම තේරුම් ගැනීමටද පහසුවකි. අනෙක් අතට අද අප ජීවත් වන 21 වන සිය වස තුළ මෙම හැදෑරීම සිදු කිරීමද වැදගත්ය. මෙහිදී මට සිහිපත් වන්නේ ඇලෙක්ස් ඉන්ක්ලස් නම් සමාජ විද්‍යාඥයා තමාගේ නූතන මිනිසා පිළිබඳ න්‍යාය. (Theory of modern Man) ඉදිරිපත් කරමින් පැවසූ අදහසකි. එනම් නව මිනිසෙකු නව සමාජයට හඳුන්වා දීමට සමාජයේ පවතින සමාජ ආයතනය කෙසේ දායක වනවාද? බටහිර සමාජයේ දකින එම දායකත්වය පෙරදිග සමාජයේ එපරිද්දෙන්ම සිදු වෙනවාද මෙරට සමාජ ජීවිතයට බලපෑම් සහගත ආයතනයක් වූ දහම් පාසල සැබවින්ම නූතන මිනිසා නිර්මාණය කරයිද? අනෙක් අතට නව සමාජයේ අගනා ගම් පුරුෂාර්ථ සමග පෙරට යන නූතන මිනිසෙකු අද දහම් පාසලෙන් බිහිකරනවාද යන්න විග්‍රහාත්මකව තේරුම් ගැනීම වැදගත්ය.

අද දහම් පාසලට පිවිසෙන දරු පිරිස වයස 8-16 තරම් වන වයස් කාණ්ඩවල සිටින අය බව සත්‍යයකි. මෙම වයස් සීමාව ළමා පෞරුෂය සමග සම්බන්ධව බලන විට අතිශය චිත්තවේගී හැඟීම්බර කාලච්ඡේදයකි. ආදරය කරුණාව මෙන්ම රැකවරණය ඔවුනට වැඩියෙන්ම ලැබිය යුතු කාලයකි. මෙබඳු වයස් මට්ටමක සිටින දරුවන් භාරකාරත්වයට ඉගෙනුමට යොමු කරනු ලබන ගුරු පිරිස පිළිබඳව දැඩි අවධානයක් හා නෛතික රැකවරණයක් ජපානය වැනි රටවල ඇත. එයට හේතුව සැබවින්ම පරිණත ජීවිත අවබෝධය හා සමාජ දැක්ම සමග අදාළ විෂය දරුවාට ලබාදීමට ඔවුන්ට හැකියාවක් පැවැතිය යුතුවීමයි. එම හැකියාව කැපවීමෙන් හා අධ්‍යාපන සුදුසුකම් මත ලබාගත් හැකියාවකි. එහෙත් සැබවින්ම මෙරට දහම් පාසල්වල උගන්වන්නේ එබඳු පරිසමාප්ත ගුරුවරුන්ද? එය එසේ නොවන්නේ අද දහම් පාසල ආරම්භක පරමාර්ථවලින් පරිබාහිර තවත් පාසලක් නිසයි. සැබවින්ම අද එය පන්සලේ තවත් නවාංගයකි. එහි අරමුණ දරුවන්ට දහම් දැනුම හෝ ජීවිතාවබෝධය ලබාදීම නොව පන්සලේ ප්‍රභූ ව්‍යාප්තිය පෙන්නුම් කරන සාධකයක් ලෙස පවත්වා ගැනීමය. ඒ නිසා එහි ගුරු පදවි ලැබීමට විධිමත් පුහුණුවක් අවශ්‍ය වන්නේද නැත. එබඳු විධිමත් පුහුණුවක් දහම් පාසල් ගුරුවරුන් සඳහා ලබාදෙන ස්ථිර වැඩසටහන් ආයතන මෙහි දක්නට ලැබෙන්නේද නැත. මෙම ගුරුවරුන් බොහෝ විට රැකියා විරහිත තරුණ තරුණියන්, උසස් පෙළ වැනි විභාගයකට කිහිප විටක් පෙනී සිට ප්‍රතිඵල අපේක්ෂාවෙන් සිටින්නන්, එසේත් නැත්නම් මීට වසර කිහිපයකට පෙර විශ්‍රාම ලැබූ වැඩිහිටියන් විය හැක. මොවුන් සැබවින්ම කරන්නේ තමන් මීට පෙර වසර ගණනාවකට පෙරින් පාසලේදී උගත්, ''බුද්ධාගම'' එපරිද්දෙන්ම දහම් පාසලේදීත් ඒකාකාරීව වැමෑරීම පමණී. එහෙත් සැබවින්ම සිදුවිය යුත්තේ එයද? එවැන්නක් කිරීමට තවත් පාසලක් අවශ්‍යද? බුදු දහම තාර්කිකව වටහා දිය හැකි විෂයකි. විද්‍යාවේ දියුණුවත් සමග එහි අවශ්‍යතාව සහ තාර්කිකභාවය වඩ වඩාත් ලෝකයට දැනෙන්නට පටන් ගෙන ඇත. එහෙත් තවමත් අපට පෙනෙන්නේ ආගම හෝ බුද්ධ චරිතය වටා ගොඩනැගුණු මිථ්‍යාවන් හා මනෝ රංජිත කථා තුළින් ආගම තේරුම් කර දීමට යත්න දරන පිරිස්ය. උදාහරණ ලෙස සිදුහත් කුමරා උපත ලද විටම නෙළුම් මල් සතක් මත ඇවිදීම සිදුවූයේ කෙසේදැයි අද සිටින දරුවන්ට තේරුම් ගැනීම අපහසු කාරණයකි. එබඳු අවස්ථාවල ගුරුවරුන්ගේ සුලබ ප්‍රතිචාරය වන්නේ එය එසේ පිළිගත යුතු දෙයක් බවය. දෙවියෙකු නොවී මිනිසෙකු වී ලොවට නුවණ දුන් උතුම් මිනිසෙකු අද්භූත පුදුම මිනිසෙක්ය යන වැරදි අදහසක් ඒ සමග මතු වී නොයෙයිද? බිම වැටුණු මල් පූජා කිරීමෙන් එම මල් සංඛ්‍යාවේ තරමට වාර ගණනක් පහළ යැයි සම්මත කුලවල ඉපදෙනවා යන ප්‍රවාදයද එලෙස පහසුවෙන් ඉවත ලිය හැකි ප්‍රවාදයක් නොවේ. කුලය බුදු දහම ප්‍රතිපත්තිමය වශයෙන් පිළිනොගත්තක් වුවත්, මිනිසා උසස් වන්නේ කුලය නිසා නොව ක්‍රියාව නිසාය යන්න නිරන්තරයෙන්ම පන්සලේදී ඇසෙන බණ පදයක් වුවත්, මෙරට සංඝ සංවිධානය තුළ කුලය ප්‍රබල ස්ථරායන ලකුණක් බව ප්‍රකට රහසකි. ඇතැම් බෞද්ධ නිකායන්ගේ ප්‍රභවය හා විකාශනයේ පදනම ලෙසද පහත රට පහත් යැයි සැලකෙන කුලයන් සැලකිය හැකි බව එසේ ජේ. තම්බයියා, එච්.එල්. සෙනවිරත්න (1973,1999) යන සමාජ විද්‍යාඥයින් සිය ආනුභවික අධ්‍යයනයන්ගෙන් පෙන්වා දී ඇත. හින්දුවාදය ප්‍රතිපත්තිමය ලෙස කුලවාදය පිළිගෙන ඇති අතර එම ආගම ඒ අනුව ස්ථර ගත වී ඇත. එහෙත් ලංකාවේ පවතින බව කියන නිර්මල බුදු දහම තුළ කුලවාදයට ඉඩක් නැති තත්ත්වයක මෙරටේ ගිහි සමාජය බලන විටද කුලය කිසිවිටෙකත් මියයමින් පවතින ප්‍රපංචයක් නොවන බව ස්ථිරවම කිව හැක. එසේ නම් බුදු දහමින් බෞද්ධ ආයතනත් බොදු ජනතාවත් පෝෂණය කිරීමට අදාළ බලධාරීන් සමත් වී නැතැයි පිළිගැනීම අසාධාරණද? දහම් පාසල මතුකර පෙන්වන්නේ එයට වඩා වෙනස් පරමාදර්ශී තත්ත්වයක් වීමට ඉඩක් නැත. ඇතැම් දහම් පාසල්වල උගන්වන පහළ යැයි සම්මත කුලවලින් පැවත එන දක්ෂ තරුණයන්, කුල හීනයන් නිසා තමන්ගේ දරුවන්ට ඉගැන්වීමට ඔවුන් යොදා නොගතයුතුය යන ඉල්ලීම කුලවත් මව්පියන්ගෙන් දැඩිව ඉදිරිපත් වන දහම් පාසල් මෙරටේ ඇත. මෙය අතිශයින් ශෝචනීය තත්ත්වයකි. කෙසේ වුවද මෙබඳු ඕලාරික චරිත දහම් ගුරුවරුන් වීමේ තවත් අනිටු ඵලයක් වන්නේ බුදු දහමේ නොවැදගත් දෑ අතිශයින් වැදගත් තීරණාත්මක කරුණු ලෙස වරදවා ඉගැන්වීමයි. එබඳු දෙය අතපසුවීම, නොකිරීම, වැරදීම් සමාවක් දිය නොහැකි දඬුවම්ය. උදේ පන්සිල් නොගැනීම, පූජාවට මල් නොමැතිව පැමිණීම, දහම් පාසලේදී පාවහන් පැළඳවීම සුදු ඇඳුම කිළිටුව පැවතීම. යම් යම් ගාථාවන් කටපාඩම් කර නිතර කීමට නොහැකි වීම ඉන් කිහිපයකි. මෙවැනි දෑ පොදු ආගමික හැසිරීමේ අතිශය නොවැදගත් කාරණා වෙති. ඒවා සමස්ත ජීවිතයම කණපිට පෙරළිය හැකි අයෝමය ජීවිත සිදුවීම් නොවේ.

දෙවැනුව නූතන දහම් පාසලේ උගන්වන විෂය මාලාව පිළිබඳවද විවේචන පවතී. බුද්ධාගම ඉහත පෙන්වා දුන් පරිදි පාසල් අධ්‍යාපනයේ පළමු ශ්‍රේණියේ සිට 12 වන ශ්‍රේණිය දක්වා උගන්වනු ලබන විෂයකි. නූතන තරගකාරී අධ්‍යාපන තරගයට මුහුණ දී සිටින සිසුන්ගේ පැත්තෙන් සැබවින්ම එය වැදගත් විෂයක් නොවේ. එය කෙසේ වුවද දහම් පාසල තුළදීද තමාට හමුවන එම විෂයම යළිත් කරපින්නා ගැනීමට සිදුවීම දෙමාපියන් විසින් තමන් මත පටවන අනවශ්‍ය බරක් ලෙස සැලකීමට බොහෝ සිසුන් පෙළඹී සිටිති. අනෙක් අතට තම ජීවිතයේ තමනට මුහුණදීමට සිදුවන විවිධ යොවුන් ගැටලුවලට නොබියව මුහුණ දිය හැකි සවිමත් පෞරුෂයක් දහම් පාසලෙන් නොලැබෙන බවද ඔවුන්ට ස්ථිරව තේරුම් යෑම ස්වභාවිකය. මේ තත්ත්වය වඩාත් හොඳින් අවබෝධ කර ගත හැක්කේ පසුගිය මාස 6ක පමණ කාලයක් තුළ පමණක් අපට අසන්නට ලැබුණු බාලවයස්කාර සියදිවි නසාගැනීම් හා වෙනත් අපගාමී ක්‍රියාවන් කිහිපයක් ගැඹුරින් හැදෑරීමෙනි. ඉන් පළමුවැන්න. මහනුවර පහළොස්වියැති සහ දා හස් වියති පෙම්වතුන් යුවළක් මව්පිය විරෝධය නිසා මහවැලි ගඟට පැන සියදිවි නසා ගැනීමය. දෙවැන්න මාවනැල්ල 16 වියති දැරියක් සිය ඥාති සොහොයුරාගේ ලිංගික හිංසනයන් ඉවසිය නොහැකිව සිය දිවි හානි කර ගැනීමයි. මෙය බැලූ බැල්මට දහම් පාසලට අදාළ නැති අපගාමී චර්යා දෙකක් සේ පෙනී ගියද, මෙතැන පැහැදිලිවම නූතන වෙළෙඳ සමාජයේ මංමුලාවූ නොමේරූ තරුණයන්ට ආගමින් මඟපෙන්වීමක් නොමැති තත්ත්වයක් හඳුනාගත හැකි යැයි සිතමි. දෙවනුව තමාගේ දුක රහසිගතව සාවධානව අසා ඊට නිසි පිළියම් ලබා දිය හැකි දයාබරිත ගුරු පිරිසක් නොමැති බවද පෙන්වන්නකි. එමෙන්ම මෙරටේ මෑතදී දක්නට ලැබෙන පිරිමි ගණිකාවන්ගේ ව්‍යාප්තිය, සමාජ රෝගවලට ගොදුරු වූ පාසල් සිසුන් ආදිය පෙන්වා දෙන්නේ ඔවුන් දහම් පාසල් ගියාද නැද්ද යන්න නොව මෙරටේ දහම් අධ්‍යාපනය පුද්ගල පෞරුෂය නංවාලීම අතින් තවමත් ප්‍රශස්ත මට්ටමකට ළඟා වී නැති බවයි. තායිලන්තය වැනි බෞද්ධ රටවල තත්ත්වය මෙයට වඩා වෙනස්ය.

මෙබඳු ව්‍යාකූල සංකීර්ණ සමාජ වාතාවරණයක දහම් පාසල් විශේෂයෙන් නාගරිකයේ දහම් පාසල් දැන් ඉංග්‍රීසි මාධ්‍යයෙන් උගන්වන දහම් පාසල් බවට පත්වීමේ නැඹුරුවක් දක්නට තිබීම සැබැවින්ම හාස්‍යයට කරුණකි. සමාජ පන්තිය, පන්ති පදනම, අද පාසල්වලින්ද අපට හඳුනාගත හැක්කකි. එහෙත් කන්නන්ගර අධ්‍යාපන දර්ශනය වූයේ මධ්‍ය මහා විදුහල් කේන්ද්‍ර කරගත් දීප්තිමත් අධ්‍යාපනික කුසලතාවන්ගෙන් පිරුණු ස්වභාෂා මාධ්‍යයෙන් ඉගෙන ගත් තරුණ පිරිසක් නිර්මාණය කිරීමය. මෙම පන්ති පදනම සංකේතවත් වන්නේ ඉංග්‍රීසියෙනි. එය අද භාෂාවකට වඩා ගරුත්ව සංකේතයකි. සැබවින්ම දහම් පාසල් පැවතිය යුත්තේ ඉංග්‍රිසි ඉගෙනීමටද? තමා ඉංග්‍රීසි දත් බව සෙසු අයට පෙන්වීමද? ඉංග්‍රීසි අධ්‍යාපනය හොඳින් හදාළ පියදස්සී හිමි නාරද හිමි වැනි ද්වී භාෂා උගතුන් තම පන්සල්වල ඉංග්‍රීසි මාධ්‍ය දහම් පාසල් ආරම්භ කිරීමට උනන්දු නොවුණේ උන්වහන්සේලා මේ සැබෑ යථාර්ථය මැනවින් තේරුම් ගෙන සිටි නිසා යැයි සිතිය හැක. මෙලෙස මෙබඳු පන්ති පදනමක් නූතන දහම් පාසල තුළ නිර්මාණය වෙද්දී විවිධ වර්ගයේ ආධාර එකතු කිරීම් සම්මාදම්ද දක්නට ලැබේ. අතිවිශාල සෙසු පිරිසක් සිටින ජනප්‍රිය නාගරික පන්සල්වල පවතින දහම් පාසල්වල මේ තත්ත්වය දැකිය හැක.

මෙයින් පැහැදිලව පෙනී යන්නේ නූතන යුගයේ දහම් පාසල ජනප්‍රිය බුදු දහමට ගොදුරු වූ පන්සලේ තවත් එක් නවාංගයක් පමණක් බවයි. මෙහිදී මට සිහිපත් වන්නේ මෙයට වසර 40 කට පමණ පෙර බුදු දහම නැංවීමට කළ යුතු නිර්දේශ, යෝජනා සාකච්ඡා කළ සභාවකදී ආචාර්ය ඊ.ඩබ්. අදිකාරම් පැවසූ අදහසකි. එම සභාවේ සාකච්ජා කළ කොමිෂන් වාර්තාවෙහි අඩංගු නිර්දේශවල බුදු දහමේ දියුණුව පිණිස කළ යුතු යෝජනා රාශියක් අඩංගු වී තිබියදී ආචාර්ය අදිකාරම් පැවසුවේ මෙබඳු අදහසකි. ''මෙම කොමිසමෙන් කියා තිබෙන මේ කිසිවක් බුද්ධාගම දියුණු කිරීමට කළ යුතු නැහැ. කළ යුතු එකම දෙය පන්සල්වල සිටින හාමුදුරුවරුන් බුදු දහමට හරවා ගැනීම පමණයි.'' මෙයින් පෙනෙන්නේ නූතන සඟ සසුනේ අර්බුදය බුදු සසුනේ හැම අංශයක් කරාම විහිද ඇති බවයි.

ඕල්කොට්, මලලසේකර එෆ්.ආර්. සේනානායක වැනි නායකයන් එදා දුටු සමාජ අභියෝගවලට වඩා දැවැන්ත සමාජ අභියෝගවලට නූතන බෞද්ධයා මුහුණ දී ඇත. ඔවුන්ගේ දරුවන්ද තියුණු අධ්‍යාපන තරගයකට මුහුණ දෙමින් සිටිති. මේ දෙපිරිස අතර එනම් දරුවන් සහ මව්පියන් අතර බරපතළ සංස්කෘතික පරතරයක් නූතන සමාජය නිර්මාණය කරනු ලැබ ඇත. එසේ නම් සැබවින්ම මේ දරුවන්ට දිය යුත්තේ කුමක්ද? මේ යුගයට ගැළපෙන සමබර පෞරුෂයක් ගොඩනගා ගැනීමේ ශක්තිමත් මඟපෙන්වීමකි. ඒ සඳහා බුදු දහම තරම් කාලානුරූප විද්‍යාත්මක ආගමක් අපට සිහිපත් කළ නොහැක. දරුවන්ට ලබාදිය යුතු ඒ මගපෙන්වීම ආනන්දයෙන් ප්‍රඥාවට යාහැකි මඟපෙන්වීමක් මිස බොහෝ කලක් ආනන්දය තුළම නැළවී සිටි ආශ්වාදජනක මඟපෙන්වීමක් නොවේ. තමා තමාට පහනක් වෙමින් සමාජය තේරුම් ගැනීමට බෞද්ධ දරුවන් හුරු විය යුතුය. හුරු කළ යුතුය. එය යුගයේ අවශ්‍යතාවකි. ■